1

# ලෝකය හරි ලස්සනයි



මහෝත්තම දෙවි පියාණන් වහන්සේ
හරි හොඳයි.
අපට ලස්සන ලෝකයක් මවා දුන්නා.
හරිම ලස්සනයි.

# 2

# මගේ සිරුර

මගේ ශරීරය බොහොම වටිනවා.
මා එය පිරිසිදුව තබා ගන්නවා.



මට සිරුර ලබා දුන් මහෝත්තම දෙවි පියාණන් වහන්සේට මම ආදරෙයි.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 1හි ඇත. (පිටු අංක 23)



නොමිලේ බෙදහැරීම සඳහා ය.

3

# අපේ පවුල


අම්මා තාත්තා හරි හොඳයි - අපට ආදරෙයි
අක්කා අයියා නංගී මල්ලී - හරිම එකමුතුයි



මට අම්මා, තාත්තා
සහෝදර සහෝදරියන්
ලබා දුන් මහෝත්තම
දෙවි පියාණන්
වහන්සේට ස්තුතියි.

# අපේ නෑදෑයෝ

ආච්චි සීයා එක්වෙලා - කියති නිතර රස කතා
නැන්ද මාමා සමඟිනා - සිටිමු තුටින් අපි සැමා




අප නෑදෑයින්ට ආදරය කරන විට මහෝත්තම දෙවි පියාණන් වහන්සේ අපටත් ආදරය කරන සේක.

# 4

# දේව ආදරය තුළින් අපට ලැබුණු තවත් අය

අපේ ගුරුවරුන් තුළින් මහෝත්තම දෙවි පියාණන් වහන්සේ අපට ආදරය කරන සේක.



ජේසුස් වහන්සේ වගේ අපිත් අසල්වැසියන්ට සහ යහළුවන්ට උදව් වෙමු.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 2හි ඇත. (පිටු අංක 24)

5

# දෙවිඳුන් මැවූ ලස්සන ලෝකය රැක ගනිමු

මල් නෙළන්න නම්
ගෙඩි කඩන්න නම්
සුරකිමු ගස් වැල්




කීච් බීච් හඬ අසන්න නම්
සතුන්ගේ සුරතල් බලන්න නම්
ඔවුන් රකිමු එක් වී සතුටින්

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 3හි ඇත. (පිටු අංක 25)

6

# කිතුනු දරුවා හොඳ ළමයෙකි



ජේසු කුමරු මෙන් අපිත්

දෙවි පියාණන් වහන්සේට යදිමු.

දෙමව්පියන්ට කීකරු වෙමු.


වැඩිහිටියන්ට ගරු කරමු.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 4හි ඇත. (පිටු අංක 26)

# 7

# මහෝත්තම දෙවි පියාණන් වහන්සේට කතා කරමු

හිස නමා - දණ ගසා
වඳිමු අපේ දෙවි පියා
මහෝත්තම දෙවි පියාණෙනි, අපට දුන්
හැමදේටම ස්තුතියි.



උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 5හි ඇත. (පිටු අංක 27)

# 8

# සාන්ත කුරුසිය

උදේ සවස අපි - අඳිමු කුරුසේ නළලේ
තොල් දෙක මතටත් - පපුවේ මැදටත්
අඳිමු අඳිමු කුරුසේ.



උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 6හි ඇත. (පිටු අංක 28)

# 9

# මම දේව දරුවකු වෙමි

මා ප්‍රසාද ස්නාපනය ලැබුවා.
එදා සිට මා දේව දරුවෙක් වුණා.
එලෙස ම මා කිතුනු පවුලට පිළිගනු ලැබුවා.



උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 7හි ඇත. (පිටු අංක 29)

# 10

# සාන්ත මරියනි දේව මෑණියනි



දේව අම්මේ,

ඔබ තුමිය බැහැපත් ය, යහපත් ය.

ජේසු සමිඳුන්ගේ

අම්මා වීමට වාසනාව ලැබුවේ

ඔබ තුමිය පමණක් ය.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 8හි ඇත. (පිටු අංක 30)

11

# සුරැකි පියා වන ශුද්ධ වූ ජුසේ තුමා



මෙලොවෙ දී කුඩා ජේසුස් වහන්සේ රැක බලාගත්තේ ශුද්ධ වූ ජුසේ තුමා යි.

ශුද්ධ වූ ජුසේ තුමා වඩු වැඩ කළා.

කුඩා ජේසුස් වහන්සේ සුරැකි පියාට නිතර ම උදව් කළා.

ඒ වාගේ අපිත් අපේ දෙමව්පියන්ට උදව් කරමු.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 9හි ඇත. (පිටු අංක 31)



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## 12

# ජේසුස් වහන්සේගේ උපත



ජේසු කුමරුගේ උපතයි - ගවලෙනයි
සමගිය සාමය සපිරුණු - නත්තලයි
බෙදා හදා ගැන්මයි - සැම සිත් සතුටුයි
ගැලැවුම්කරුවාණෙනි
මේ තුති ඔබ වහන්සේට යි.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 10හි ඇත. (පිටු අංක 32)

## 13

# ජේසුස් වහන්සේගේ පුදුම ක්‍රියා

කානාවේ මඟුල් ගෙදර - මිදි යුස මදි වූවා
ජේසු සමිඳු ආවා - ජලය රැස් කෙරෙව්වා
ආසිරි ගැන්වූවා - දිය මිදි යුස වූවා
සැවොම පුදුම වූවා - සතුටින් තුති පිදුවා




උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 11හි ඇත. (පිටු අංක 33)

# 14

# කුරුසිය ජයගත් ජේසුස් වහන්සේ

ජේසුස් වහන්සේ
දුක් වින්දේ මා නිසයි.




මරණයට පත් වුණේ
මගේ වැරදි නිසයි.
උත්ථාන වුණේ මට
ආදරේ නිසයි.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 12හි ඇත. (පිටු අංක 34)

# 15

# ශුද්ධ බයිබලය



මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදර වචන අඩංගු වී තිබෙන්නේ ශුද්ධ බයිබලයේ ය. කිතුනු අපේ උතුම් ම පොත ශුද්ධ බයිබලය යි.

**දේව වචනයට සවන්දෙමු; කියවමු; පිළිපදිමු.**

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 13හි ඇත. (පිටු අංක 35)



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

16

# ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා



ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා අපේ රටේ අපෝස්තුලුවරයා ය.
ශ්‍රී ලංකාවට බිහිවුණු වීරෝදාර සාන්තුවරයාණෝ එතුමාණෝ ය.

# 17

# සාන්ත ආනාතුමිය

ආනා මැණී - ජුවකීම් පියෙණී
මරි මව ඔබේ දෝණී
ආදරයෙන් හොඳ නරක කියා දී
හැදූ සුදුවර දෝණී



දෙවි සමිඳුට ආදරේ කළා
දෙව් මව් ලැබුණා තැගි ලෙසා
ජේසු සමිඳු මුණුබුරු වූවා
දෙවි සමිඳුන් හට තුති පිදුවා

18


# සාන්ත අන්තෝනි මුනිතුමා



ශුද්ධ වූ අන්තෝනි මුනිතුමා
ප්‍රාතිහාර්යයේ සාන්තුවරයාණෝ ය.
නැති වූ දේවල් සොයා ගැනීමට
පිහිට වන්නේ මෙතුමාණෝ ය.

19

# සාන්ත සෙබස්තියන් මුනිතුමා



බෝවන රෝග සුව කිරීමට අප වෙනුවෙන් මැදිහත් වන්නේ සාන්ත සෙබස්තියන් මුනිතුමා ය.

# 20

# අතිඋතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා



ශුද්ධ වූ සභාවේ වර්තමාන නායකයාණෝ
අතිඋතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම
පියතුමාණෝ ය.
ආර්ජන්ටිනාව එතුමාගේ උපන් රටයි.
එතුමාණන් වාසය කරන්නේ රෝම නගරයේ ය.
ශුද්ධෝත්තම පියතුමා වෙනුවෙන්
අපි සැමදා යාච්ඤා කරමු.

ක්‍රි

යා

කා

ර

ක

ම්

ඔබේ රූපය අඳින්න. පාට කරන්න.

දෙවිඳුනි,

මා මැව්වාට ඔබ වහන්සේට

ස්තුතියි.


ආමෙන්.

ඇමුණුම් අංක 2


පාට කොළවලින් මලක් කපා අලවා සැමදෙනාටම සුබ පතමු.


දෙවිඳුන්ගේ ආදරයයි - ලැබුණු අය ගොඩයි.


කැමති සුරතලා ව තෝරන්න.
බලා අඳින්න. පාට කරන්න.











මහෝත්තම දෙවි පියාණන් වහන්සේ අපට
දුන් ලෝකය තවත් ලස්සන කරමු.

ඇමුණුම් අංක 4

මෙහි හොඳ වැඩ දක්වෙන පින්තූරවලට අදාළ අංක වටා රවුමක් අඳින්න.

1



5



2



6



3



7



4



8




ඇමුණුම් අංක 5

පුංචි ඔබ දේව තාත්තාට යාච්ඤා කරන ආකාරය අඳින්න.

ඇමුණුම් අංක 6

පාට කඩදාසි තීරු දෙකක් කපා කුරුසිය මත අලවන්න.



ඇමුණුම් අංක 7

ඔබ කැමති පාට පැන්සලකින් තිත් ඉරි උඩ අඳින්න.

මම

සුහද

ස්වාගතය

ලැබුවෙමි.

ඇමුණුම් අංක 8

පාට කොළ ඉරා අලවා මල ලස්සන කරන්න.




කුඩා ජේසු සමිඳුන් දේව මෑණියන්ට ආදරය කළාක් මෙන් ඔබත් ඔබේ අම්මාට ආදරය කරන බවට දේව මෑණියන්ට පොරොන්දු වෙන්න.

වඩු වැඩ සඳහා භාවිත කළ උපකරණ සොයා, පුටුවේ රූපයට යා කරන්න.




මෙම නත්තල් ගස සරසන්න.



ජේසු කුමරු මෙන් අපිත් බැහැපත් වෙමු.

කොඩි ගසේ ඇති වචනවල අඩු අකුරු පුරවන්න.

| |
|---|
| නා |
| හා |
| මි |
| සු |
| ගෙ |



| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රා | ති | | ර් | ය | ය |

| | | | |
|---|---|---|---|
| | දි | යු | ෂ |

| | | | | |
|---|---|---|---|---|
| ජේ | | ස | මි | ඳු |

| | | | | |
|---|---|---|---|---|
| කා | | නු | ව | ර |

| | | | | | |
|---|---|---|---|---|---|
| ම | ගු | ල් | | ද | ර |


ඇමුණුම් අංක 12

හොඳ වැඩ කරන්න. ඔබ කරන හැම හොඳ වැඩක් වෙනුවෙන් ම මෙහි මලක් අලවන්න. කටු ඔටුන්න වෙනුවට මල් ඔටුන්නක් සාදන්න.



★ චතාරික කාලය පුරාවටම මෙය ක්‍රියාත්මක කරන්න.

කඩ ඉරි යා කරන්න. පහන පාට කරන්න.



ශුද්ධ බයිබලයට ගරු බුහුමන් දක්වන්න.